ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement

2026.07.24 චක්‍රලේඛ අංක: **64/2026**

සියලුම දිසා කොමසාරිස්වරුන් වෙත,

**ජාතික බාලදක්ෂ සේවා සහ මහජන සම්බන්ධතා ව්‍යාපෘතිය - 2026**

2026 වසරෙහි ජාතික බාලදක්ෂ සේවා හා මහජන සම්බන්ධතා ව්‍යාපෘතිය අගෝස්තු මස 08 වන දින සිට සැප්තැම්බර් මස 07 වන දින දක්වා පැවැත්වීමට කටයුතු සූදානම් කෙරෙමින් පවතී. ඒ අනුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස දිසා කොමසාරිස්වරුන් හට උපදෙස් දෙන අතර, සේවා ව්‍යාපෘතිය දිස්ත්‍රික් මට්ටමින් සාර්ථකව පැවැත්වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික කටයුතු සම්පාදනය කරන ලෙස දිසා කොමසාරිස්වරුන් හට උපදෙස් දෙනු ලැබේ.

**1. කාල රාමුව:**

ජාතික බාලදක්ෂ සේවා සහ මහජන සම්බන්ධතා ව්‍යාපෘතිය 2026 අගෝස්තු මස 08 වන සෙනුරාදා සිට සැප්තැම්බර් මස 07 වන සඳුදා දක්වා පැවැත්වේ. (අධ්‍යාපන අමාත්‍යාංශයෙහි අනුමැතිය ඉදිරියේදී දිස්ත්‍රික්ක වෙත යොමු කෙරේ).

**2. සේවා ව්‍යාපෘතියේ අරමුණු:**

බාලදක්ෂයින් තුළ ශ්‍රමාභිමානය හා අවංක සේවයෙහි ඇති වටිනාකම් පිළිබඳ ආකල්ප ඇති කිරීම සහ බාලදක්ෂ කණ්ඩායම් පවත්වාගෙන යාම හා ඒවායෙහි ක්‍රියාකාරකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන අරමුදල් රැස්කිරීම සේවා ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ.

**3. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය:**

- බාලදක්ෂයන්ගේ පවුලේ සාමාජිකයින්, මිතුරන්, ඥාතීන් සහ අසල්වාසීන්ගේ සහයෝගය සහිතව සේවා ව්‍යාපෘතියෙහි නිරත වන මෙන් සියලුම බාලදක්ෂයින්ට උපදෙස් දෙනු ලැබේ.
- සේවා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම බාලදක්ෂයන් හට තම හිතවතුන් හා අවට ප්‍රදේශයේ ආයතන වෙත ගොස් කල් ඇතිව සිදු කිරීමට ඇති වැඩකටයුතු වෙන් කර ගැනීමට දිරිගැන්විය යුතුය.
- සේවා මාසය තුළ අවම වශයෙන් බාලදක්ෂයින් දෙදෙනෙකු එක්ව හෝ 04 දෙනෙකුගෙන් යුත් කාණ්ඩයක් සේවයෙහි නිරත වන මෙන් උපදෙස් දෙනු ලබන අතර, තනි තනි වශයෙන් සේවා ව්‍යාපෘතියෙහි නිරත වීම දිරිමත් නොකෙරේ.
- ශ්‍රමයේ වටිනාකම වටහාගත හැකි වන පරිදි මූල්‍යමය දායකත්වයක් ලබා ගැනීමට බාලදක්ෂයන් යොමු කළ යුතු අතර, සේවා පත්‍රිකාවෙහි (වැඩසති පත්‍රිකාව) දායකත්වය සටහන් කිරීමට පෙර බාලදක්ෂයන් විසින් භාරගත් සේවය සතුටුදායක ලෙස ඉටු කළ යුතුය.

65
9
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.
Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

**4. සහභාගීත්වය:**

- දෙමාපියන්ගේ සහ බාලදක්ෂ නායකයින්ගේ අධීක්ෂණය යටතේ වයස අවුරුදු 5 සිට 18 දක්වා වයස්වල බාලදක්ෂයන් සේවා ව්‍යාපෘතිය සඳහා සහභාගී වීම අපේක්ෂා කෙරේ.
- බාලදක්ෂ හා පෝතක බාලදක්ෂ අංශය සේවා ව්‍යාපෘතියෙහි නියුක්ත වන අතර, ඔවුන්ට අමතරව, සිඟිති බාලදක්ෂ අංශය සහ මානවක බාලදක්ෂ අංශයට ද ඔවුන්ගේ අභිමතය පරිදි සේවා ව්‍යාපෘතියේ නිරත වීම පිණිස දිරිමත් කරනු ලබන අතර, එය ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කරනු ලබන අරමුදල් රැස් කර ගැනීමට උපකාරී වනු ඇත.

**5. ආදායම බෙදා හැරීම:**

ජාතික බාලදක්ෂ සේවා සහ මහජන සබඳතා ව්‍යාපෘතියේ ආදායම පහත පරිදි බෙදා හරිනු ලැබේ.

| කාණ්ඩය | ප්‍රතිශතය | අරමුණ |
|---|---|---|
| බාලදක්ෂ කණ්ඩායම | 60% | අදාළ බාලදක්ෂ කණ්ඩායමෙහි කටයුතු සංවර්ධනය කිරීම සහ බාලදක්ෂ ක්‍රියාකාරකම් සඳහා මෙම අරමුදල් යොදාගත යුතු ය. |
| දිස්ත්‍රික්කය | 25% | දිස්ත්‍රික්කයෙහි බාලදක්ෂ කටයුතු සංවර්ධනය කිරීම සඳහා මෙම අරමුදල් යොදා ගත යුතු ය. |
| ජාතික මූලස්ථානය | 15% | ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්කවල කටයුතු සංවර්ධනය කිරීම සඳහා මෙම අරමුදල් යොදා ගැනේ. |

**6. ඇගයීම:**

ජාතික බාලදක්ෂ සේවා සහ මහජන සබඳතා ව්‍යාපෘතියේ ක්‍රියාකාරීව නිරත වීම සඳහා බාලදක්ෂයින් දිරිමත් කරනු උදෙසා වන, විශේෂ ත්‍යාග සහ ඇගයීමේ ක්‍රමය ජාතික, දිස්ත්‍රික් සහ ඒකක මට්ටමින් මෙවර ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

2025 සේවා මාසයේදී වාර්තා වූ ඉහළම කුසලතා සහ කාර්ය සාධනයන් 2026 සේවා මාසය ආරම්භයේදී ඇගයීමට ලක් කෙරේ.

**7. සේවා පත්‍රිකා:**

2026 ජූලි මස 25 වන දින වන විට සේවා පත්‍රිකා දිස්ත්‍රික්ක වෙත බෙදා හරිනු ලබන අතර, බාලදක්ෂ කණ්ඩායම් වෙත එම සේවා පත්‍රිකා කල්තබා බෙදා හැරීමට දිස්ත්‍රික්ක විසින් කටයුතු කළ යුතු ය.

දිස්ත්‍රික්ක විසින් පළමුව අවශ්‍ය සේවා පත්‍රිකා සංඛ්‍යාව පමණක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වන අතර, අවශ්‍ය පරිදි අමතර සේවා පත්‍රිකා ජාතික මූලස්ථානයෙන් ලබා ගත හැකි ය.

තවද, කණ්ඩායම් මට්ටමින් සේවා පත්‍රිකා අස්ථානගත වීම අවම කිරීම සඳහා දිස්ත්‍රික්ක විසින් පියවර ගත යුතු ය.

## 8. දිසා කොමසාරිස් විසින් ගත යුතු කඩිනම් ක්‍රියාමාර්ග:

පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි වහා අවධානය යොමු කරන ලෙස දිසා කොමසාරිස්වරුන් හට උපදෙස් දෙනු ලැබේ.

8.1 සේවා ව්‍යාපෘතිය දිස්ත්‍රික්කය තුළ සංවිධානය කිරීම සඳහා දිස්ත්‍රික් සංවිධායකවරයෙකු සහ කණ්ඩායමක් පත් කිරීම (මුදල් කටයුතු භාර සහකාර දිස්ත්‍රික් කොමසාරිස් දිස්ත්‍රික් සංවිධායක ලෙස පත් කිරීම වඩා සුදුසු වේ).

8.2 දිස්ත්‍රික් සංවිධායකවරයාගේ විස්තර (නම/වට්ස්ඇප් අංකය/විද්‍යුත් ලිපිනය) 2026 ජූලි මස 25 දින වන විට ජාතික මූලස්ථානය වෙත යොමු කිරීම (කරුණාකර slscout5@yahoo.com යන විද්‍යුත් ලිපිනය වෙත සහ 0764792425 යන වට්ස්ඇප් අංකය වෙත විස්තර යොමු කරන්න)

8.3 සේවා පත්‍රිකා ලබා ගැනීම සඳහා පහත සඳහන් ලේඛන හා සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු අතර එයට අදාළ ලේඛන සූදානම් කර ගැනීම:

අ) 2025 වසර සඳහා බලපත්‍ර නවීකරණය අවසන් කිරීම.

ආ) 2025/2026 වසර සඳහා සංගණන මුදල් ගෙවා ලියාපදිංචි කටයුතු අවසන් කිරීම.

ඇ) 2025 වසර සඳහා දිස්ත්‍රික්කයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් හෝ ආදායම්-වියදම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.

ඈ) ජාතික මූලස්ථානයට අයවිය යුතු මුදල් හෝ වගකීම් වේ නම් ඒවා සම්පූර්ණයෙන් පියවීම.

8.4 සේවා ව්‍යාපෘතිය මහජනතාව අතර ප්‍රවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික්කය තුළ පුළුල් ප්‍රචාරණ වැඩසටහනක් සැලසුම් කිරීම සහ එමගින් මහජනතාව අතර බාලදක්ෂ ව්‍යාපාරයෙහි ප්‍රතිරූපය නැංවීමටත්, ව්‍යාපාරය තවදුරටත් ව්‍යාප්ත කිරීමටත් අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.

8.5 ජාතික බාලදක්ෂ සේවා සහ සම්බන්ධතා මාසයේ නිල සමාරම්භ උත්සවයක් දිස්ත්‍රික්කය තුළ සූදානම් කිරීම.

## 9. වැඩිදුර විස්තර

වැඩි විස්තර සඳහා 2026 බාලදක්ෂ සේවා සහ සම්බන්ධතා ව්‍යාපෘතියෙහි ජාතික සංවිධායක වශයෙන් කටයුතු කරනු ලබන සඳුන් ජීවන්ත පතිරණ මහතා (විශේෂ කොමසාරිස්) - දුරකථන අංකය: 0754 403 142 හෝ සම්පත් කාරියවසම් මහතා - සහාය ප්‍රධාන කොමසාරිස් (කළමනාකරණ හා මූල්‍ය) - දුරකථන අංකය: 0713 840 948 මගින් සම්බන්ධ කර ගත හැකිය.

වැඩිදුර උපදෙස් ඉදිරියේදී නිකුත් කෙරේ.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු

සම්පත් කාරියවසම්
සහාය ප්‍රධාන කොමසාරිස් (කළමනාකරණ හා මූල්‍ය)

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත්:

- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයෙහි ගරු සභාපති, විධායක සභා සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික
- ජාතික මූලස්ථානයෙහි සියලුම කොමසාරිස්වරුන්
- කාර්යාල ලිපි ගොනුවට

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka